ඩී පී එඩියුකේෂන් කෝඩින් පාසල

**Homework Assignment 99-C**

# 99-C

# ඔබේම App එකක් නිර්මාණය කරමු




DP EDUCATION Coding School

LIVEWORKSHEETS

මේ වන විට ඔබ dpcode.lk හි මුල් ව්‍යාපෘති 100 හා එක් එක් ව්‍යාපෘති සඳහා නියමිත ගෙදර වැඩ 100 ක් ද අවසන් කර ඇත. එම සියළුම ව්‍යාපෘති හා අභ්‍යාස මගින් මේ වන විට code.org වෙබ් අඩවියේ Sprite Lab, Artist, App Lab, Game Lab හා Dance Party යන සෑ ම අංශයක් ම අධ්‍යයනය කර ඇත.




මෙම ගෙදර වැඩ පැවරුම මගින් App Lab භාවිතා කර ඔබේම ඇප් එකක් නිර්මාණය කරන ආකාරය බලමු.

මේ සඳහා පළමුව, App Lab පිළිබඳව ඉගෙනගත් කරුණු සිහිපත් කරගැනීමට පහත දැක්වෙන කෙටි පාඨමාලාව අධ්‍යයනය කරන්න.

**Intro to App Lab** කෙටි පාඨමාලාව අධ්‍යයනය කරන්න

ඩීපී එඩියුකේෂන් කෝඩින් පාඨමාලාව හදාරන සිසු සිසුවියන් පිරිසක් විසින් නිර්මාණය කරන ලද ඇප් 10 ක් පහතින් ඉදිරිපත් කරමු. එම සෑම ඇප් එකක් ම හොඳින් අධ්‍යයනය කර ඔබේම ඇප් එකක් නිර්මාණය කරන්න.

LIVEWORKSHEETS

## 01 – හද ගී පො ත - ළමා ගීත එකතුව





පැ රණි ළමා ගීත 50 ක එකතුවක් ලෙස මෙම ඇප් එක නිර්මාණය කර ඇත. සෑම ගීතයක ම පද මාලාව නරඹමින් එම ගීත ශ්‍රවණය කිරීමට හැ කිය.

මෙහි Screens 52 ක් ඇති අතර පළමු පිටුවේ (startScreen තුළ) ඇති dropDown ලයිස්තුවක් මගින් ගීත තෝරා ගැනීමට අවස්ථාව සලසා ඇත. ඇප් එක නිර්මා ණය කිරීමට codes දෙදහසකට අධික ප්‍රමාණයක් හා විතා කර ඇත.

ඇප් එක බලන්න

## 02 – Travel Companion - සංචාරක සහකරු




සංචා රකයන් සඳහා මගපෙන්වීමට නිර්මාණය කර ඇති මෙම ඇප් එක මගින් ශ්‍රී ලංකා වේ එක් එක් දිස්ත්‍රික්ක තුළ වූ නැරඹුම් ස්ථාන පිළිබඳ විස්තර ඇතුළත් කර ඇත. ඒ සෑම ස්ථානයකම ඡායා රූපයක් මෙන්ම සිතියමෙහි පිහිටීමද දැ ක්වේ.

මෙහි Screens 28 ක් ඇති අතර පළමු පිටුවේදී ලංකා සිතියම තුළ නිරූපණය වන සේ දිස්ත්‍රික්කය තේරීමට අවස්ථාව සලසා ඇත. ඇප් එක නිර්මාණය කිරීමට codes තුන් දහසකට අධික ප්‍රමාණයක් හා විතා කර ඇත.

ඇප් එක බලන්න

LIVEWORKSHEETS

**03 – අ.පො.ස. උ.පෙළ නර්තනය - නිර්දේශිත ගායනා**




**අ.පො.ස. උ.පෙළ නර්තනය විෂයේ 12 සහ 13 ශ්‍රේණිවලට අයත් නිර්දේශිත** ගායනා එකතුවක් ලෙස මෙම ඇප් එක නිර්මාණය කර ඇත. අධ්‍යාපනික මෘදුකාංගයක් ලෙස සංවර්ධනය කර ඇති මෙහි ශාන්තිකර්ම ගායනා හා ජන ගායනා ඇතුළත් වේ

මෙහි Screens 33 ක් ඇති අතර පළමු පිටුවේ (startScreen තුළ) අදාල ශ්‍රේණි තෝ රා ගැ නීමට අවස්ථා ව සලසා ඇත. ඇප් එක නිර්මා ණය කිරීමට codes එක්දහස් හත්සීයයකට අධික ප්‍රමාණයක් භාවිතා කර ඇත.

ඇප් එක බලන්න

**04 – Travel Companion - සංචාරක සහකරු**





ශ්‍රී ලංකාවේ වඩාත් ප්‍රචලිත සංචාරක ආකර්ෂනය දිනාගත් ස්ථාන පිළිබඳ මෙම ඇප් එක නිර්මාණය කර ඇත.

මෙහි Screens 104 ක් ඇති අතර ඇප් එක නිර්මා ණය කිරීමට codes අටසියයකට අධික ප්‍රමාණයක් භාවිතා කර ඇත.

ඇප් එක බලන්න

LIVEWORKSHEETS

## 05 – Travel Assistant - සංචාරක සහායක




සංචා රකයන් සඳහා  මගපෙන්වීමට නිර්මාණය කර ඇති මෙම ඇප් එක මගින් ශ්‍රී ලංකාවේ එක් එක් දිස්ත්‍රික්ක තුළ වූ නැරඹුම් ස්ථාන පිළිබඳ විස්තර ඇතුළත් කර ඇත. ඒ සෑම ස්ථානයකටම අදාලව සිතියම, Tripadvisor හා booking.com වෙබ් අඩවිවල සඳහන් සංචාරක හොටල් සහ නවාතැන්හල් පිළිබඳ සබැඳි මෙන්ම වීඩියෝ දර්ශන හා කාලගුණ දත්ත ද ඇතුළත් කර ඇත.

මෙහි Screens 21 ක් ඇති අතර ඇප් එක නිර්මා ණය කිරීමට codes තුන්දහසකට ආසන්න ප්‍රමාණයක් භාවිතා  කර ඇත.

ඇප් එක බලන්න

## 06 – Travel Ideas in Sri Lanka - සංචාරක සහකරු





සංචාරකයන් සඳහා  මගපෙන්වීමට නිර්මාණය කර ඇති මෙම ඇප් එක මගින් ශ්‍රී ලංකා වේ එක් එක් පළාත් තුළ වූ නැරඹුම් ස්ථා න පිළිබඳ විස්තර ඇතුළත් කර ඇත. ඒ සෑම ස්ථා නයකම ඡායා රූපයක් මෙන්ම සිතියමෙහි පිහිටීමද දැ ක්වේ.

මෙහි Screens 56 ක් ඇති අතර පළමු පිටුවේදී ශ්‍රී ලංකාවේ පළාත් තේරීමට අවස්ථා ව සලසා එම පළාත් තුළ ඇති නැරඹුම් ස්ථාන දක්වා ඇත. ඇප් එක නිර්මා ණය කිරීමට codes අටසියයකට අධික ප්‍රමාණයක් භාවිතා  කර ඇත.

ඇප් එක බලන්න

LIVEWORKSHEETS

## 07 – සත්ව විවිධත්වය




7 ශ්‍රේණියේ විද්‍යාව විෂයයට අයත් සත්ව විවිධත්වය පාඩම සඳහා සකස්කළ අධ්‍යාපනික ඇප් එකක් ලෙස මෙය ගොඩනගා ඇත.

මෙහි Screens 36 ක් ඇති අතර ඇප් එක නිර්මා ණය කිරීමට codes දෙසිය විස්සකට ආසන්න ප්‍රමාණයක් භාවිතා කර ඇත.

ඇප් එක බලන්න

## 08 – පරිත්‍රාණ ධර්ම දේශනා





පරිත්‍රාණ ධර්ම දේශනා යනුවෙන් නිර්මාණය කර ඇති මෙම ඇප් එක මගින් මහපිරිත, මංගල සූත්‍රය, රතන සූත්‍රය ආදී වශයෙන් පිරිත් දේශනා නමයක් ශ්‍රවණය කළ හැකිය. ඩීපී එඩියුකේෂන් හා සම්බන්ධ වූ රඹුක මහා විද්‍යාලයේ තිරාජ් ප්‍රභාෂ විසින් 6 ශ්‍රේණියේ ඉගෙනුම ලබද්දී මෙම ඇප් එක නිර්මාණය කර ඇත්තේ කෝඩින් පාඨමාලාවේ 34 වෙනි ව්‍යාපෘතියේ ඇති “Animal Sounds” නම් වූ පාඩමෙන් ලත් දැනුමෙන් ය.

මෙහි ඇත්තේ එක් Screen එකක් පමණක් වන අතර ඇප් එක නිර්මා ණය කිරීමට භාවිතා කර ඇත්තේ ද codes තිහක් පමනි.

ඇප් එක බලන්න

LIVEWORKSHEETS

## 09 – ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨ රජවරු




ඉතිහාසය විෂයයට වැදගත් වන ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨ රජවරු පිළිබඳ සකස්කළ අධ්‍යාපනික ඇප් එකක් ලෙස මෙය ගොඩනගා ඇත. අනුරාධපුර යුගය, පොළොන්නරු යුගය ආදී වශයෙන් සියළු යුගවලදී රජකළ රජවරුන් පිළිබඳ විස්තර මෙහි ඇතුළත් කර ඇත.

මෙහි Screens 76 ක් ඇති අතර ඇප් එක නිර්මා ණය කිරීමට codes පන්සියයකට අධික ප්‍රමාණයක් භාවිතා කර ඇත.

ඇප් එක බලන්න

## 10 – සත්ව ලෝකය




විද්‍යාව විෂයයට වැදගත් වන පරිදි සත්ව ලෝකය පිළිබඳ සකස්කළ අධ්‍යාපනික ඇප් එකක් ලෙස මෙය ගොඩනගා ඇත.

මෙහි Screens 44 ක් ඇති අතර පළමු පිටුවේදී ජීවීන් වර්ගීකරණය, ජීවන චක්‍ර, ජීවීන්ගේ ශබ්ද හා දැනුම පරීක්ෂා කිරීමට යොමු ලබාදී ඇත. ඇප් එක නිර්මා ණය කිරීමට codes හත්සියයකට ආසන්න ප්‍රමාණයක් භාවිතා කර ඇත.

ඇප් එක බලන්න

LIVEWORKSHEETS